වේල්ස් කුමරි විදුහල මොරටුව
**Princess of Wales' College - Moratuwa**

| 45 | S | II |
|---|---|---|

**13 වන ශ්‍රේණිය - පළමුවන වාර ඇගයීම**
**Grade 13 – 1st Term Test – Nov 2018**

**බෞද්ධ ශිෂ්ටාචාරය - II**
**Buddhist Culture - II**

**කාලය පැය 03 යි**
**Three Hours**

නම :- ………………………………………………………………………….. පන්තිය :- ………………………

**උපදෙස් :** **මෙම පත්‍රය කොටස් දෙකකින් යුක්තයි. I කොටසින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

## I කොටස

**පහත ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 2 කට පිළිතුරු ලියන්න.**

1.
(i) බුදු රජාණන් වහන්සේගේ අෂ්ට විද්‍යා ඥානය නම් කරන්න.
(ii) ශාස්තෘවරයෙක් වශයෙන් බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඇගයීමට ලක් කරන්න.
(iii) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන පද්මාකාර ජීවිතය පැහැදිලි කරන්න.
(iv) බුදු රජාණන් වහන්සේ භාවිතා කළ ධර්ම දේශනා ක්‍රම හතරක් හඳුන්වා දෙන්න.
(v) බුදු රජාණන් වහන්සේ සතුව පැවති පුරිස ධම්ම සාරථි ගුණය පැහැදිලි කරන්න.
(ලකුණු 4 x 5 = 20)

2.
(i) බ්‍රාහ්මණ වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න.
(ii) බ්‍රාහ්මණ දහමේ ඉගැන්වෙන ආශ්‍රම ධර්ම හඳුන්වන්න.
(iii) අධිකම ලාභයට වයස් භේදයක් හෝ කුල භේදයක් නොමැති බව බුදු දහමට අනුව තහවුරු කරන්න.
(iv) කාන්තාව සතු ස්වාධීනත්වය බමුණු දහම තුළින් ප්‍රතික්ෂේප කළ ආකාරය පැහැදිලි කරන්න.
(v) කාන්තාව ආගමික වශයෙන් ලද නිදහස බුදු දහමට අනුව අගය කරන්න.
(ලකුණු 4 x 5 = 20)

3.
(i) ෂඩ් ශාස්තෘන් නම් කොට, ඔවුන්ගේ ඉගැන්වීම් නම් කරන්න.
(ii) සදාචාර සංවර්ධනය සඳහා එම ඉගැන්වීම්වල බලපෑම පෙන්වා දෙන්න.
(iii) නිගණ්ඨනාථපුත්තතුමාගේ දර්ශනයට අනුව කර්මවාදය කෙටියෙන් පැහැදිලි කරන්න.
(iv) එම ඉගැන්වීම් පිළිබඳව බෞද්ධ මතය ගෙනහැර දක්වන්න.
(v) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිශාවන්ට ආදේශිත සමාජ සම්බන්ධතාවල වැදගත්කම පෙන්වා දෙන්න.
(ලකුණු 4 x 5 = 20)

Artsapi.lk

## II කොටස

**පහත ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 3 කට පිළිතුරු ලියන්න.**

1.
(i) බුද්ධ කාලයේ පැවති පැවිදි උපසම්පදා ක්‍රම 8 හඳුන්වන්න.
(ii) බුදු දහමේ ඉගැන්වෙන වස්සාවාස චාරිත්‍රය ගිහි පැවිදි දෙපාර්ශවයේ ම යහපතට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.
(iii) පළමු ධර්ම සංගීතියේ දී ගනු ලැබූ තීන්දු තීරණ බුදු සසුනේ යහපැවැත්මට හා ව්‍යාප්තියට හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.
(iv) ධර්මාශෝක රජුගේ දහම සැමට යහපත ගෙන දීමට සකස් වූවකි. විමසන්න.

(ලකුණු 5 x 4 = 20)

2.
(i) දසරාජ ධර්ම යහපත් රාජ්‍ය පාලනයට මඟ පාදන බව තහවුරු කරන්න.
(ii) රාජාණ්ඩු හා සමූහාණ්ඩු පාලන ක්‍රම සමාජය කෙරෙහි බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
(iii) ක්‍රි. පූ. 6 වන සියවස වන විට භාරතීය සමාජය නාගරීකරණයට නතු වෙමින් පැවති ආකාරය විමසීමට ලක් කරන්න.
(iv) යථාලාභ සංතෝෂය සමාජ සුරැකීමෙහිලා බලපාන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 5 x 4 = 20)

3.
(i) බෞද්ධ ඉගැන්වීමට අනුකූලව සිදු කරනු ලබන ධන උපාර්ජනයෙන් සමාජ සුභ සිද්ධියට සිදුවන මෙහෙය අගය කරන්න.
(ii) ශ්‍රමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමේ ඇති වටිනාකම තහවුරු කරන්න.
(iii) සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ උපදේශයන් කොතෙක් දුරට නූතන ආර්ථික ගැටළු විසඳා ගැනීමට උපකාරී වේ දැයි පරීක්ෂා කරන්න.
(iv) පංචශීලය ආරක්ෂා කිරීම තුළින් ඇතිවන සමාජ සුරක්ෂිතතාවය ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 5 x 4 = 20)

4.
(i) ජපන් ජන සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වී ඇති ආකාරය පරීක්ෂා කරන්න.
(ii) ස්ථූප නිර්මාණයේ ආරම්භය හා විකාශනය පිළිබඳ විවරණයක් කරන්න.
(iii) ගන්ධාර හා මථුරා බුදු පිළිමවල එකිනෙකට වෙනස්ව දක්නට ලැබෙන ලක්ෂණ පෙන්වා දෙන්න.
(iv) වලභි විශ්ව විද්‍යාලයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 4 = 20)

5.
(i) ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවති විශ්වාස මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයෙන් පසු අර්ථාන්විත වූ ආකාරය පරීක්ෂා කරන්න.
(ii) පැරණි සිංහල සාහිත්‍යයේ පෝෂණයට බුදු සමයෙන් ලැබුණු ආලෝකය විමසීමට ලක් කරන්න.
(iii) ලාංකීය රාජ්‍ය පාලනය සඳහා බුදු දහමින් ලැබුණු දායකත්වය අගය කරන්න.
(iv) සංඝමිත්තා තෙරණියගේ වැඩමවීම ලාංකික ඉතිහාසයේ නව පිටුවක් සනිටුහන් කිරීමට සමත් විය. පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 4 = 20)

Artsapi.lk